## Abstract No 82

# පාලියෙහි විද්‍යමාන වෛදික භාෂා ලක්‍ෂණ (අට්ඨක - පාරායන වග්ගයන් ආශ්‍රයෙනි.)

**ඔක්කම්පිටියේ යසස්සි හිමි**
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලයය.
**කුඹුරුවෙල සීලානන්ද හිමි**
සම්භාව්‍ය භාෂා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලයය.
seelanandakumburuwela@yahoo.com

ශ්‍රී මුඛ දේශනාගත පාලිය වනාහි මධ්‍යතන ඉන්දු ආර්ය භාෂාවකි. මෙකී පාලි භාෂාව තුළ පූර්වතර වූ වෛදික භාෂාවෙහි ආභාසය දැකගත හැකි ය. පෞරාණික බුද්ධ දේශනාවන් වන සුත්ත නිපාතාගත අට්ඨක සහ පාරායන වග්ගයන් මේ විෂයෙහි ආශ්‍රයකර ගතිමු. ඒ අනුව එකී ලක්‍ෂණයන් පහත පරිදි දැක්විය හැකි ය. අකාරාන්ත නාම වරනැගීම්හි තෘතීයා විභක්ති බහුවචනය **හි** ප්‍රත්‍යය සහිත ව පාලියේ වරනැගෙයි. වෛදිකයේ මෙය **භිස්** ප්‍රත්‍යය සහිත ව වරනැගී ඇත. (**චතුබ්භි වාතෙහි අසම්පකම්පියො.**) මහාප්‍රාණය ලොප් වී **හ කාරය** පමණක් අවශේෂිත රූපයක් වෛදික ආභාසය මත පාලියෙහි විද්‍යමාන ය. (**චතූහපායෙහි ච විප්පමුත්තො.**) වෛදිකයේ භාවිත **තවෙ, තවයි, තායෙ** යන තුමන්ත ක්‍රියාරූප පාලියෙහි ද එලෙස ම විද්‍යමානය. (**දක්ඛිතායෙ අපරාජිත සංසං.**) වෛදිකයේ වර්තමානකාල, කර්තෘකාරක, පරස්මෛපද, උත්තමපුරුෂ, බහුවචන **මසි** ප්‍රත්‍යය **මසෙ** යැයි පාලියේ යෙදී ඇත. (**අකුසලා සමූහතාසෙ.**) වෛදිකයේ ප්‍රථමා විභක්ති බහුවචන රූපයෙහි **ආසස්** ප්‍රත්‍යය පාලියේ **ආසෙ** යැයි දක්නට ඇත. (**පච්චයාසෙ'ති**) ඒකාරාන්ත ව වර්තමාන පඨමපුරිස ඒකවචනය යෙදීම වෛදිකයේ මෙන් ම පාලියෙහි ද සමාන ය. (**ඛත්තියෙ ජායතෙ කුලෙ.**) අකාරාන්ත නාමපද වරනැගීමේ දී තතියා ඒකවචනය ආකාරන්ත වීම ද වෛදික භාෂා ලක්‍ෂණයකි. පාලියෙහි ද මෙය විද්‍යමාන ය. (**යෙ සුප්පයුත්තා මනසා දළ්හෙන.**) ආඛ්‍යාත වරනැගීමේ දී ප්‍රථමපුරුෂ බහුවචන ප්‍රත්‍යයක් ලෙසට **රෙ** ප්‍රත්‍යය වෛදිකයේ සහ පාලියේ යෙදෙයි. (**තෙච පාපෙසු කම්මෙසු අභිණ්හමුපදිස්සරෙ.**) උත්තමපුරුෂ බහුවචනය උකාරාන්ත වීම ද වෛදික ලක්‍ෂණයකි. පාලියෙහි ද එය භාවිත වෙයි. (**විහරෙමු දිවසං.**) වෛදිකයේ ආත්ම ශබ්දයේ විකල්ප රූපයක් ආතුම ලෙස දැකගත හැකි ය. පාලියෙහි ද මෙය විද්‍යමාන ය. (**යො ආතුමානං සයමෙව පාවා.**) ස්වර මධ්‍ය ඩ, ඪ අක්‍ෂර වෛදිකයෙහි ළ, ළ්හ වෙයි පාලියෙහි ද මෙම ලක්‍ෂණය ඇත. (**බ්‍රහ්මා දළ්හපරක්කමො.**) සංයුක්තාක්‍ෂර සරල කිරීමට අක්‍ෂර මධ්‍යයට ස්වරයන් යෙදීම (ස්වර භක්තිය) වෛදිකයෙහි මෙන් ම පාලියෙහි ද විද්‍යමාන ය. (**යො ගිලානං උපට්ඨෙය්‍ය.**) වෛදික ලේට් ලකාරය පාලියෙහි ආකාරාන්ත ව (දීර්ඝ ව) භාවිත වෙයි. (**සබ්බස්ස ආසවා ඛීණා.**) වෛදිකයෙහි භාවිත ථ ප්‍රත්‍යය සහිත ආශිර්වාද ක්‍රියාව පාලියෙහි භාවිත වෙයි. (**පුට්ඨො මෙ භගවා ව්‍යාකරොථ.**) වෛදික ප්‍රථමා ඒකවචනයේ භාවිත ඕ ප්‍රත්‍යය පාලියෙහි ද භාවිත වෙයි. (**බුද්ධො අහූ මංගලො**) වෛදිකයෙහි චතුර්ථී විභක්තිය සැදෙනුයේ ෂෂ්ඨී විභක්ති සාම්‍යයෙනි. පාලියෙහි චතුත්ථී විභත්තිය ඡට්ඨී විභත්තියට සාම්‍යය. වෛදික ද්විවචනය ආකාරන්ත ව ම යෙදෙයි. පාලියෙහි ද මෙම ලක්‍ෂණය ඇත. (**පෙසලා සාරිපුත්තමොග්ගල්ලානාති.**) වෛදිකයෙහි සහ පාලියෙහි පදාන්ත වූ හලන්ත ශබ්දයන්ගේ අන්ත ලෝපය වූ කල්හි **පච්ච, උච්ච** යැයි සමාන ව ම වරනැගෙයි. මෙකී භාෂා ලක්‍ෂණ විමසීමේ දී මධ්‍යතන යුගයට අයත් පාලි භාෂාවෙහි සංවර්ධනය උදෙසා සංස්කෘතයට වඩා ආභාසයක් ලැබුණේ වෛදික භාෂාවෙන් ය යන්න ප්‍රකට වෙයි.

**ප්‍රමුඛපදඃ-** පාලි, ඉන්දු ආර්ය, වෛදිකභාෂා, විභක්ති